# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல / My Ref. | ඔබේ අංකය / உமது இல / Your Ref. | දිනය / திகதி / Date |
|---|---|---|
| CSS/7/1/9/2018 | | 2018.01.30 |

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 04-2018**

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ව්‍යවස්ථාපිත අධිකාරී/ආයතන ප්‍රධානීන් වෙත.

<u>සභාපතිවරු,විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂකවරු සහ නිරීක්ෂකවරු සඳහා දීමනා ගෙවීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 3/2015 හා 2015.06.17 දිනැති ලිපිය අනුව දකුණු පළාත් සභාවේ ව්‍යවස්ථාපිත ආයතන වල සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට දීමනා ගෙවීමේදී ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන මා විසින් නිකුත් කර ඇති අංක CSS/7/1/1/2016 හා 2016.10.11 දිනැති ලිපියේ සඳහන් අනුමත සංශෝධිත දීමනා ගෙවීම කළ යුතුය. (එම ලිපියෙහි පිටපතක් මේ සමග අමුණා ඇත.)

**02.** තවද මෙම දීමනා ගෙවීම් කිරීමේදී PED 3/2015 චක්‍රලේඛයේ අඩංගු පහත සඳහන් අංක යටතේ වන කරුණු ද අදාළ කර ගත යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

**2.3** පූර්ණ කාලීන පදනමක් මත එක් ඒකකයකට වඩා වැඩි ගණනක සභාපති, විධායක අධ්‍යක්ෂක හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂක තනතුරුවලින් කුමක් හෝ දරන පුද්ගලයෙක් සියලු ඒකක වලින් සම්පූර්ණ දීමනාව ලබා ගත නොහැකිය.ඒ වෙනුවට පත්වීම් ලිපියේ හෝ කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් ඒ සම්බන්ධයෙන් කලින් දුන් තීරණයක විරුද්ධව කුමක් සඳහන් වුවද පහත සඳහන් ආකාරයට ඔහුට / ඇයට දීමනා ලබා ගත හැකිය.

- පළමු කාර්යාලයෙන් පූර්ණ දීමනාව
- දෙවන කාර්යාලයෙන් දීමනාවෙන් 50% ක්
- තුන්වන කාර්යාලයෙන් දීමනාවෙන් 25% ක්

රාජ්‍ය සේවයේ හෝ යම් වෙනත් රජයට අයත් ව්‍යවසායක පූර්ණ කාලීන පදනමින් ස්ථිරව සේවය යොදවා ඇති පුද්ගලයෙක් එම තනතුරට හිමි වැටුපක් සහ අනෙකුත් ප්‍රතිලාභ ලබා ගන්නා අතර පූර්ණ කාලීන පදනමකින් වෙනත් රාජ්‍ය ව්‍යවසායක සභාපතිවරයෙක් හෝ විධායක අධ්‍යක්ෂවරයෙක් හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කර ඇති නම් ඔහු පත් කර ඇති එම රාජ්‍ය ව්‍යවසායෙන් නියමිත දීමනා වලින් 50%ක් පමණක් ලබා ගැනීමට හිමිකම් ලැබේ


| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office | 091 2234052 / 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site | www.cs.sp.gov.lk |
|---|---|---|---|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

**2.4** සභාපති , විධායක අධ්‍යක්ෂ හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂ යන තනතුරුවල රාජ්‍ය ව්‍යවසාය තුනකට වඩා වැඩි ගණනක සේවය කිරීම සඳහා යම් පුද්ගලයෙකුට දීමනා ලබා ගත නොහැක.

**2.5** එකම ඒකකයක ස්ථිර තනතුරක වැඩ ආවරණය කරන යම් සභාපතිවරයෙකු ,අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ,විධායක අධ්‍යක්ෂවරයෙකු හෝ නිරීක්ෂකයෙකු සඳහා යම් අමතර ගෙවීමක් කල නොහැක.

**2.6** සභාපති, විධායක අධ්‍යක්ෂක හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂක ලෙස වැඩ බලන යම් නිලධාරියකු එම තනතුරේ අවම වශයෙන් අඛණ්ඩව දින 28 ක් සේවය කර තිබේ නම් එසේ සේවය සැපයූ කාලපරිච්ඡේදය සඳහා අදාල දීමනාවෙන් 50% වැඩ බලන දීමනාවන් සඳහා ඔහුට හිමිකම් කර ඇත.

**2.7** අදාල ආයතනය ප්‍රවාහන පහසුකම් එම පුද්ගලයාට ලබා දී නැත්නම් දුර සැලකිල්ලට ගැනීමෙන් පසු අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකුට හෝ නිරීක්ෂකයෙකුට අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලට හෝ අධ්‍යක්ෂක මණ්ඩලවල අනුකමිටු රැස්වීම් වලට සහභාගී වීම සඳහා සාධාරණ ප්‍රවාහන දීමනාවන් ගෙවිය හැක.

**2.9** රාජ්‍ය ව්‍යවසායන්හි සභාපතිවරු රාජ්‍ය ව්‍යවසායන් හි රාජ්‍ය සේවකයින් ලෙස නොසලකන නිසා ඔවුන්ට ගෙවන දීමනා මත සේවක අර්ථසාධක අරමුදලට හෝ සේවා භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීමට යටත් නොවේ.

**2.10** සභාපතිවරයාට විධායක අධ්‍යක්ෂකට / ක්‍රියාකාරී අධ්‍යක්ෂකට වන මාසික දීමනා හා විධායක නොවන අධ්‍යක්ෂක හා නිරීක්ෂකට වන රැස්වීම් දීමනා අදාල බදු අඩු කිරීමට යටත් වේ.

**2.11** විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට හා නිරීක්ෂකයින්ට ගෙවනු ලබන රැස්වීම් දීමනා සඳහා **සභාපතිවරු,** විධායක අධ්‍යක්ෂවරු සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරු හිමිකම් නොලබයි .

**2.12** මා විසින් නිකුත් කර ඇති අංක CSS/7/1/1/2016 හා 2016.10.11 දිනැති ලිපිය මගින් අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ගෙවිය හැකි වන්නේ මසකට එක් රැස්වීමක් සඳහා පමණක් බව සඳහන් කර තිබුනද විශේෂ අවස්ථා වලදී පමණක් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 3/2015 හි ඡේද අංක 2.12 අනුව රැස්වීම් දීමනා මසකට අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් දෙකක උපරිමයකට සීමා වන පරිදි මෙමගින් සංශෝධනය කරනු ඇත.

**2.14** සභාපතිවරයා, සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරියාගේ ධූරයන් දරන්නේ නම් එක් දීමනාවක් හෝ වැටුපක් පමණක් (වඩා වැඩි දීමනාව හෝ වැටුප) ඔහුට හෝ ඇයට ලබා ගැනීමට හිමිකම් ඇත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්: 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත : දැ.ගැ.ස.
03. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ , දකුණු පළාත : දැ.ගැ.ස.
04. අයවැය අධ්‍යක්ෂ, දකුණු පළාත : දැ.ගැ.ස.

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
# CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My No. CSS/7/1/1/2016 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2016.10.11

අධ්‍යක්ෂ ජනරාල්, දකුණු පළාත් සංවර්ධන අධිකාරිය.
අධ්‍යක්ෂ ජනරාල්, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
කළමනාකරණ අධ්‍යක්ෂ (වැ.බ), රුහුණු සංචාරක කාර්යාංශය.
සාමාන්‍යාධිකාරි, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.
අධ්‍යක්ෂ ජනරාල්, දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය.

<u>අමාත්‍ය මණ්ඩල තීරණ අංක 744.</u>

2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 3 /2015 අනුව දකුණු පළාත් සභාවේ ව්‍යවස්ථාපිත ආයතන වල සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට පහත සඳහන් පරිදි 2016 අගෝස්තු මාසයේ සිට සංශෝධිත දීමනා ගෙවීම සම්බන්ධව ගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 744 සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8 හා 2016.09.26 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. (එම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි).

| ආයතනය | සභාපති දීමනාව මසකට (රුපියල්) | අධ්‍යක්ෂ මණ්ඩල දීමනා මසකට (රුපියල්) |
|---|---|---|
| 01.ද.ප.මාර්ග සංවර්ධන අධිකාරිය | 60,000/- | 6000/- |
| 02.ද.ප.මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | 60,000/- | 6000/- |
| 03.රුහුණු සංචාරක කාර්යාංශය | 55,000/- | 4500/- |
| 04.ද.ප.සංවර්ධන අධිකාරිය | 55,000/- | 4500/- |
| 05.ද.ප.කාර්මික සංවර්ධන අධිකාරිය | 45,000/- | 4000/- |

අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ගෙවිය හැකි වන්නේ මසකට එක් රැස්වීමක් සඳහා පමණක් වන අතර, ගෙවීම් වලින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කිහිපයක් වුවද පැවැත්විය හැකිය.

සුනිල් දහනායක,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්),
ප්‍රධාන ලේකම් වෙනුවට,
දකුණු පළාත.

පිටපත්

01. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ.ගැ.ස.
02. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ - දැ.ගැ.ස.
03. අයවැය අධ්‍යක්ෂ - දැ.ගැ.ස.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.